# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2458/38 - 2025 ඔක්තෝබර් මස 15 වැනි බදාදා - 2025.10.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**රේගු නිවේදන**

රේගු ආඥාපනත (235 වැනි අධිකාරය)

**101 වැනි වගන්තිය යටතේ නියෝගය**

රේගු ආඥාපනතේ (235 වැනි අධිකාරය වන) (සංශෝධිත) 101 (1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මා විසින් පුනර්ජනනීය බලශක්තිය සංචය කිරීමේ පහසුකමක් ඉදිකිරීමේ කාර්යය සඳහා අනුමත ලැයිස්තුවෙහි ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය කිරීම/ දේශීයව මිලදී ගැනීම සඳහා පහසුකම් සැලසීම පිණිස නව නියෝග පැනවීම සඳහා 2018 අගෝස්තු 10 දිනැති අංක 2083/33 දරන *ගැසට් පත්‍රය* මඟින් පනවා ප්‍රකාශයට පත් කරන ලද නියෝග තවදුරටත් සංශෝධනය කිරීමට එහි 3, 4. v සහ 5 වගන්ති ඉවත්කර පහත වගන්ති ඇතුළත් කරනු ලැබේ. මෙම රෙගුලාසි 2025 ඔක්තෝබර් මස 15 දින සිට බලාත්මක විය යුතු ය.

3. මෙම නියෝග යටතේ බන්ධිත ගුදම් පහසුකමෙහි අරමුණ වනුයේ කිරි නිෂ්පාදන පහසුකමක්, ඖෂධ නිෂ්පාදන පහසුකමක්, වෛද්‍ය උපකරණ නිෂ්පාදන පහසුකමක්, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ පහසුකමක් සහ පුනර්ජනනීය බලශක්ති උත්පාදනය කිරීමේ හෝ සංචය කිරීමේ පහසුකමක් ඉදිකිරීම යන කාර්යය සඳහා 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි ව්‍යවසායකට, එකී පහසුකම ඉදිකිරීමේ කාලසීමාව තුළ, තෝරාගත් තීරුබදු සහ බදු වලින් නිදහස් කිරීමේ පදනම මත අනුමත ලැයිස්තුවෙහි ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය කිරීමේ/ දේශීයව මිලදී ගැනීම සඳහා පහසුකම් සැලසීම යි.

4.V. පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධකරණය වැඩිදියුණු කිරීම සඳහා අවම වශයෙන් මෙගාවොට් එකක (1MW) බලශක්ති උත්පාදනය කිරීමේ ධාරිතාවයක් ස්ථාපනය කිරීම හෝ මෙගාවොට් පැය එකක (1 MW h) ධාරිතාවයකින් බලශක්ති සංචය කිරීමේ පද්ධති පහසුකමක් ස්ථාපනය කිරීම.

5. උක්ත ලැයිස්තුවේ දක්වා ඇති ක්ෂේත්‍රවල පහසුකම් ස්ථාපනය කිරීම යන්නෙන් ඉහත අවම සුදුසුකම් ලැබීමේ නිර්නායකවලට යටත්ව, නව නිෂ්පාදනය කිරීමේ/ නිපදවීමේ පහසුකමක් හෝ පුනර්ජනනීය බලශක්ති සංචය කිරීමේ පහසුකමක්, ඉදිකිරීම හෝ ඵලදායීතාවය වැඩිකිරීම හෝ නිපදවීමේ ධාරිතාවය වැඩිදියුණු කිරීමට දැනට පවතින නිෂ්පාදනය කිරීමේ/ නිපදවීමේ පහසුකමක් පුළුල් කිරීමට පමණක් අදාළ වේ.

**අනුර කුමාර දිසානායක**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2025 ඔක්තෝබර් මස 14 වැනි දින,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය,
කොළඹ 01.

EOG 10 - 0169

1A - PG 7290 - 428 (2025/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*